# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,877/5 — 1969 ඔක්තෝබර් 28 වැනි අඟහරුවාදා — 1969.10.28**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලද)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ඇල්.ඩී.–බී. 73/52

### විනිමය පාලන පනත

(423 වැනි අධිකාරය වන) විනිමය පාලන පනතේ 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, මුදල් ඇමති උක්කු බණ්ඩා වන්නිනායක වන මම,

(1) එකී වගන්තිය යටතේ 1953 හි ඔක්තෝබර් 2 වැනි දින අංක 10,593 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ බලය පැවරීම, ඊට යාකොට ඇති පළමුවැනි උපලේඛනයෙහි කොළඹ, සීමාසහිත ඊස්ටර්න් බැංකුවට අදාල වන කොටස අත් හැරීමෙන් 1969 නොවැම්බර් 1 වන දින සිට මෙයින් සංශෝධනය කරමි ; තවද

(2) විනිමය සංරක්ෂණය කිරීමේ සහ එකී පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ කාර්‍යයන් සඳහා, විනිමය පාලක විසින් ලියවිල්ලකින් දෙනු ලැබිය හැකි නියෝගයනට අනුකූලව සීමාසහිත ලංකාවේ කොමර්ෂල් බැංකුව විසින්, සිය ව්‍යාපාරික කටයුතු කරගෙන යා යුතුය යන කොන්දේසියට යටත්ව, එකී පනතේ කාර්‍යයන් සඳහා සියළුම විදේශීය ව්‍යවහාර මුදල් සම්බන්ධයෙන් බලය ලත් වෙළෙඳෙකු ලෙස කටයුතු කරගෙන යාමට 1969 නොවැම්බර් 1 වැනි දින සිට සීමාසහිත ලංකාවේ කොමර්ෂල් බැංකුව වෙත මෙයින් බලය පවරමි.

1969 ඔක්තෝබර් 27 වැනි දින,
කොළඹ දී.

යූ. බී. වන්නිනායක,
මුදල් ඇමති.

10–1046

---

### ජනසතු සේවා අමාත්‍යාංශය

**1961 අංක 22 දරණ මෝටර් රථ ප්‍රවාහණ සංශෝධන පනතින් සංශෝධනය කරන ලද 1957 අංක 48 දරණ මෝටර් ප්‍රවාහණ පනත. කම්කරු විනිශ්චය සභා පත්කිරීම**

1962 මෝටර් ප්‍රවාහණ (කම්කරු කොමසාරිස් සහ කම්කරු විනිශ්චය සභා විසින් ආරාවුල් සමථයකට පත්කිරීම) රෙගුලාසිවල 4 වන රෙගුලාසියේ ප්‍රකාර, 1961 අංක 22 දරණ මෝටර් ප්‍රවාහණ පනතින් සංශෝධිත 1957 අංක 48 දරණ මෝටර් ප්‍රවාහණ පනතේ 41 වැනි වගන්තියේ විධිවිධාන යටතේ මෝටර් ප්‍රවාහන කම්කරු විනිශ්චය සභා සංස්ථාපනය කිරීමට එක් එක් නම ඉදිරිපුට ඇති දින සිට වර්ෂයක කාල පරිච්ඡේදයක් සඳහා පහත සඳහන් අය පත් කරනු ලැබ ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. එම්. පීරිස්,
ජනසතු සේවා අමාත්‍යාංශය.

කොළඹ.

| | | | |
|---|---|---|---|
| 1. | සිරිමෙවන් බිබිලේ මහතා, 4, රොඩ්නි වීදිය, කොළඹ 8 ... | ශ්‍රෙෂ්ඨාධිකරණයේ පෙරකදෝරු සහ ප්‍රසිද්ධ නොතාරිස් ... | 1.10.69 |
| 2. | අමීර් ෂෙරිප් මහතා, 59, ශාන්ත ජෝන්ස් වේ, කොළඹ 15 ... | ශ්‍රෙෂ්ඨාධිකරණයේ පෙරකදෝරු සහ ප්‍රසිද්ධ නොතාරිස් ... | 1.10.69 |
| 3. | ජේ. ඒ. මෙන්ඩිස් මහතා, 55/2, ශාන්ත විල්ප්‍රඩ් පටුගම, කොළඹ 15 | සිලෝන් තියටර්ස් සමාගමේ විශ්‍රාම ලත් (පරිපාලන) සාමාන්‍යාධිකාරි | 1.10.69 |
| 4. | ෂෙල්ටන් ද එස්. ශ්‍රී ආනන්ද මහතා, 44, මෝපිල්ඩ් පාර, කොටහේන, කොළඹ 13 | ශ්‍රෙෂ්ඨාධිකරණයේ පෙරකදෝරු සහ ප්‍රසිද්ධ නොතාරිස් ... | 1.10.69 |
| 5. | ඩී. වීරතුංග මහතා, 18/3, ඇලෝ මාවත, කොල්ලුපුටිය ... | සුප්‍රීම් උසාවියේ නීතිඥවරයෙකි. මෝටර් ප්‍රවාහණ කම්කරු සභාවේ හිටපු සභාපතිවරයෙකි | 1.10.69 |
| 6. | වී. ජී. බී. පෙරේරා මහතා, 9, ග්‍රෙගරි මාවත, කොළඹ 7 ... | බී.ඒ.(ලන්ඩන්), එල්.එල්.බී.(ලන්ඩන්) උපාධිධාරි, ශ්‍රෙෂ්ඨාධිකරණයේ අධිනීතිඥවරයෙකි. මෝටර් ප්‍රවාහණ කම්කරු සභාවේ හිටපු සභාපතිවරයෙකි | 1.10.69 |
| 7. | ඇන්ඩෲ ඇම්. ජී. ද සිල්වා මහතා, 397, ඩැම් වීදිය, කොළඹ 12 ... | සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු තැන, මෝටර් ප්‍රවාහණ කම්කරු සභාවේ හිටපු සභාපතිවරයෙකි | 1.10.69 |
| 8. | සී. පද්මනාදන් මහතා, අංක 130, හල්ස්ඩෝෆ් වීදිය, කොළඹ 12 | සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු තැන, මෝටර් ප්‍රවාහණ කම්කරු සභාවේ හිටපු සභාපතිවරයෙකි | 1.10.69 |
| 9. | ඇන්. වාගීස පෙරේරා මහතා, 115, අළුත්කඩේ වීදිය, කොළඹ 12 | සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු තැන, මෝටර් ප්‍රවාහණ කම්කරු සභාවේ හිටපු සභාපතිවරයෙකි | 1.10.69 |
| 10. | කදිරගමර් සැඩයර් අරුල්නන්දි මහතා, " නෙයිතලන්නතල් ", බීච් පාර, පේදුරුතුඩුව | විශ්‍රාම ලත් වැඩ බැලූ අධ්‍යාපන අධ්‍යක්ෂ තැන, කාර්මික විනිශ්චය සභාවේ හිටපු සාමාජිකයෙකි. මෝටර් ප්‍රවාහණ කම්කරු විනිශ්චය සභාවේ හිටපු සභාපතිවරයෙකි | 1.12.69 |
| 11. | එම්. එච්. කරීම් මහතා, අංක 9, ඇල්ප්‍රඩ් පෙදෙස, කොළඹ 3 ... | ශ්‍රෙෂ්ඨාධිකරණයේ නීතිඥ තැන, ප්‍රසිද්ධ නොතාරිස් තැන සහ මෝටර් ප්‍රවාහණ කම්කරු විනිශ්චය සභාවේ හිටපු සභාපතිවරයෙකි | 1.12.69 |

10–14 –


ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.

9A—J 7963— 11,125 (10/69)